# සරා පුරයේ
# සිරිපා පියුම



(C) Sumitha Publsihers

කියා දෙන්නේ

**ජේ. බී. දිසානායක**

චිත්‍ර ඇන්දේ

**සමන් කළුබෝවිල**



(C) Sumitha Publsihers

දහස් ගණනක්
සමනලයන්
පියාඹා යන මඟ දිගේ ගොස්
සමනල කන්දේ සිරිපා පතුල
සොයා ගත් සැටි
පුංචි ඔබට මතක ඇති.
අපේ සමනල කන්ද ගැන ආරංචිය
බෞද්ධ ලෝකය පුරා
පැතිර ගියා.

(C) Sumitha Publsihers





ලෝකයේ නොයෙක් රටවල
වන්දනාකරුවෝ
සමනල කන්ද
වැඳ පුදා ගන්ට
අපේ රටට ආවා.

(C) Sumitha Publsihers



ව්‍යවහාර වර්ෂයෙන්
සතරවෙනි සිය වසේ දී
චීනයේ සිට සිංහල දේශයට ආ
ෆා හියන් නමැති
භික්ෂුන් වහන්සේ
මුලින් ම ගියේ
අනුරාධපුරයේ
අභයගිරි විහාරයට.

(C) Sumitha Publsihers

චීනයේ වත්
සොයා ගන්ට බැරි
මහායාන පොත් දෙකක්
සොයාගෙන යි
උන් වහන්සේ
අපේ රටට වැඩියෙ.

දැවුරුද්දක් අභයගිරි විහාරෙ පොත් ගුලේ සිට
ඒ පුස්කොළ පොත් දෙක මහත් දුක සේ
පිටපත් කර ගත් උන් වහන්සේ
සමනල කඳු නැග සිරිපා පියුම්
වැඳ පුදා ගන්ටත්
අමතක කළේ නෑ.



(C) Sumitha Publsihers